**නිමැවුම් පාදක ආධාර සඳහා වන ගෝලීය හවුල් ව්‍යාපෘතිය (නිපාආගෝහ) -2012**

---

**1. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පලමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූලව 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**2.1 මූල්‍ය කාර්ය සාධනය**

------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු. 4,078,820 කි. 2012 දෙසැම්බර් 31 දිනට වියදම් සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** |
|---|---|
| | **රු.** |
| ගෘහ භාණ්ඩ උපකරණ හා සවිකිරීම් | 798,626 |
| කෙරීගෙන යන වැඩ | 3,280,194 |
| **එකතුව** | **4,078,820** |

**3. විගණන නිරීක්ෂණ**

--------------------

**3.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

ව්‍යාපෘතිය යටතේ ගෘහස්ථ මට්ටමේ සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමට සෘජු සම්බන්ධතාවයක් නොමැති රු. 3,280,194 ක් වූ ප්‍රචාරණ, පාරිශ්‍රමික, වාහන කුලියට ගැනීම හා වෙනත් අරමුණු වෙනුවෙන් දරන ලද පිරිවැය කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. තවද, 2011 දෙසැම්බර් 27 දින

ප්‍රදාන ගිවිසුම අත්සන් කර ව්‍යාපෘති කටයුතු නිල වශයෙන් ආරම්භ කර තිබුණද 2011 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් වියදම් කළ රු. 313,115 ක් ව්‍යාපෘති වියදම් ලෙස සලකා තිබුණි.

### 3.2. නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ප්‍රදාන ගිවිසුමේ ව්‍යවස්ථාවේ 2.07 (ආ) වගන්තිය අනුව සෑම ලිත් කාර්තුවක් අවසානවී දින හතලිස්පහකට පෙර ව්‍යාපෘතියේ විගණනය නොකළ අතුරු මූල්‍ය වාර්තා සකස් කර දායකත්ව නියෝජිතායතනය වෙත ඉදිරිපත් කළ යුතු අතර සෑම වර්ෂයක් අවසාන වී මාස හයක් ඉක්ම යාමට පෙර ගිණුම් කාල පරිච්ඡේදයක් සඳහාම විගණිත මූල්‍ය ප්‍රකාශන දායකත්ව නියෝජිතායතනය වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය මෙම අවශ්‍යතාවයන් සමඟ අනුකූල වී නොතිබුණු අතර 2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 පෙබරවාරි 17 දිනදීය.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මඟ පෙන්වීම් අත්පොතේ 6.4 ඡේදය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකය ව්‍යාපෘති ගනුදෙනු විගණනය කළ යුතු අතර දායකත්ව නියෝජිතායතනයටද පිටපතක් සහිතව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සභාපති වෙත ව්‍යාපෘතියට නිශ්චිත කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් ගණුදෙනු මත කිසිදු අභ්‍යන්තර විගණනයක් 2012 වර්ෂය තුළදී සිදු කර නොතිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අරමුදල් උපයෝජනය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය හා ප්‍රදාන ලැබීම් උපයෝජනය කිරීමට අදාල සැලකිය යුතු තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | ලබාදීමට එකඟ වු මුදල | | 2012 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) |
| ජාසංස ප්‍රදාන | 5.08 | 660.40 | 100 | - | - |
| ශ්‍රී.ලං.ර | 3.24 | 421.20 | 50 | 2.70 | 3.06 |
| **එකතුව** | **8.32** | **1081.60** | **150.00** | **2.70** | **3.06** |

## 4.2 භෞතික කාර්ය සාධනය

---------------------------

පවත්නා හා නව මළ ප්‍රවාහන ජාල වලට, නිවාස මළ ප්‍රවාහන සම්බන්ධතා ප්‍රමාණය වැඩි කිරීම හා ගෘහස්ථ මට්ටමින් ස්ථාන ගත සනීපාරක්ෂණ සේවා වැඩි දියුණු කිරීම මඟින් මහ කොළඹ අඩු ආදායම් නිවැසියන් වෙත සනීපාරක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් කිසිදු කටයුත්තක් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද ජාතික ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුවේ මේ සම්බන්ධයෙන් සිදු කළ රු. මිලියන 100 ක් වූ ප්‍රතිපාදන, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන වෙනත් ව්‍යාපෘති වැඩ වලට මාරු කර තිබුණි.